# 12 ලියුමක් ඇවිත්



අයියේ, අන්න ලියුම් මාම ඇවිත්.

මම ලියුම ගන්නම් නංගී.

විරාජ් කියන්නෙ පුතා ද?

ඔව් ....... ඔව් ....... මාමෙ.

මෙන්න ඔයාට ලියුමක්.

බොහොම ස්තුතියි මාමෙ.

අයියේ කවු ද ලියුම එවල තියෙන්නෙ.?

සමන් අයියා එවල තියෙන්නෙ.

නිවාඩු කාලෙ මම ගියේ එයාලගෙ ගෙදර නෙ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙන්න නංගී ලියුම. කියවන්න.

මධ්‍ය මහා විද්‍යාලය,
හුණුමුල්ල.
2008. 11. 10

සෙත් වේවා!

ආදරණීය විරාජ්,

ඔබේ අලුත් තොරතුරු මොනවා ද? සුවයෙන් ඇතැ යි සිතනවා. ඔබ එවූ ලිපිය ලැබුණා. එයට ස්තුති යි! ඉන් පසු තොරතුරක් දන්වන්න නොහැකි වීම ගැන කනගාටු වෙනවා. ඔයා දැන් පන්තියේ වැඩ හොඳින් කරනවා නේ ද? මම නම් හැමදා ම හොඳින් පාඩම් කරනවා. අම්මලා තාත්තලා මහන්සි වෙන්නේ අපට උගන්වන්නනෙ.

මේ සැරේ පාසලේ ක්‍රීඩා තරගවලට මමත් හිටියා. මීටර් සීය, දෙසීය තරග මම දිව්වා. මීටර් සීය තරගයෙ මම දෙවෙනියා. මීටර් හාරසීය තරගයට සාමල් ඉදිරිපත් වුණා. අලුත් තරග දෙකකුත් තිබුණා. ඒවා තමයි කිරි බීමේ තරගයයි බතල කෑමේ තරගයයි. කිරි බීමේ තරගෙට අට වැනි පන්තියෙ ළමයි හිටියේ. අපේ අයියා ලීටර් භාගයයි බීවෙ. සුනිමල් ලීටර් එක හමාරක් බීවා. එයාට තමයි ජය.

බතල කෑමේ තරගයට හිටියේ එකොළහේ පන්තියෙ ළමයි. පිට අයත් සහභාගි වුණා. හැම දෙනාට ම මුලින් ම ග්‍රෑම් තුන්සීය ගාණේ දුන්නා. සමහරු නම් හුඟාක් කෑවා. පිට අයගෙ තරගෙන් පීතර මාමා තමයි දිනුවේ. එයා ග්‍රෑම් පන්සිය හැටතුනක් කාලා තිබුණා. සමහරු බතල ගිලපු හැටි බලන්න ලස්සනයි. අපට හරි ම හිනා. දැන් හුඟක් ලීවා නේ. දැනට මේ විස්තර ඇති නේ ද?

ඔයාලගෙ ගෙදර සියලු දෙනා ම සුවෙන් ඇතැ යි සිතනවා. අපේ ගෙදර අය ඔයා නිතර ම මතක් කරනවා. ලබන පාසල් නිවාඩුවටත් ඔයා අපේ ගෙදර එන්න. ඔබ සැමට ම ජය හා සතුට ලැබේවා!

මෙයට හිතවත්,
සමන්.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

බලන්න නංගි මේ ලියුමෙ සැලැස්ම. මේ වාගෙ ලිපි අප යවන්නේ අපේ මිතුරන්ට, නෑදෑයන්ට වගේ අයට.

යවන්නාගේ ලිපිනය හා දිනය

ආශීර්වාදය

ආමන්ත්‍රණය

පණිවිඩය හෝ දැන්විය යුතු තොරතුරු

අවසානය

මම බලාගත්ත අයියේ. ඔයාට ගොඩක් ස්තුතියි!

නංගි, අපි සමන්ට ලියුමක් ලියල යවමු.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 1

**පහත දක්වා ඇති ලිපිනයන් පිළිවෙළට සකස් කර ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.**

(1)

කුරුණෑගල
2008. 11. 20
පැරකුම්බා වීදිය
අංක 13

→

- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -

(2)

2008. 10. 28
අංක 18
නාරංගොඩ.
මිතුරු මාවත

→

- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -
- - - - - - - - - - - - - -

## ක්‍රියාකාරකම 2

හිතවතුන්ට ලියන ලිපිවල දී භාවිත කළ හැකි ආශීර්වාද පහක් ලියන්න.

උදාහරණය :- සැපවේවා!

(i) - - - - - - - - - - - - - - - - - - - - - - -

(ii) - - - - - - - - - - - - - - - - - - - - - - -

(iii) - - - - - - - - - - - - - - - - - - - - - - -



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iv) - - - - - - - - - - - - - - - - - - - - - - -

(v) - - - - - - - - - - - - - - - - - - - - - - -

## ක්‍රියාකාරකම 3

පහත සඳහන් අය සඳහා යෙදිය හැකි වඩාත් සුදුසු ආමන්ත්‍රණය බැගින් ලියන්න.

උදාහරණය :- මවට - ආදරණීය අම්මා වෙත.

ගුරුතුමාට - - - - - - - - - - - - - - - - - -

පූජ්‍යවරයකුට - - - - - - - - - - - - - - - - -

මිතුරකුට - - - - - - - - - - - - - - - - - - -

මාමාට - - - - - - - - - - - - - - - - - - -----

විදුහල්පතිතුමාට - - - - - - - - - - - - - - -

## ක්‍රියාකාරකම 4

ලිපියක අවසානය යෙදිය හැකි ආකාර පහක් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

උදාහරණ :- මේ,

ළබැඳි සොයුරු,

පුලස්ති.

(i) ______________________

______________________

______________________

(ii) ______________________

______________________

______________________

(iii) ______________________

______________________

______________________

(iv) ______________________

______________________

______________________

(v) ______________________

______________________

______________________



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 5

විරාජ් සහ නංගි එක් ව සමන්ට ලියන ලද පිළිතුරු ලිපිය ලියන්න. විරාජ්ගේ පාසලේ ක්‍රීඩා තරග තොරතුරු ද ඊට ඇතුළත් කරන්න.

## ක්‍රියාකාරකම 6

තම සමීප මිතුරකුට / මිතුරියකට යැවීමට ලිපියක් ලියන්න.

## ක්‍රියාකාරකම 7

**පහත සඳහන් සංඛ්‍යා හඬ නගා කියවන්න. රටා හඳුනා ගන්න.**

| | | | |
|---|---|---|---|
| 100 | සියය | 101 | එකසිය එක |
| 200 | දෙසියය | 205 | දෙසිය පහ |
| 300 | තුන්සියය | 310 | තුන්සිය දහය |
| 400 | හාරසියය | 425 | හාරසිය විසි පහ |
| 500 | පන්සියය | 560 | පන්සිය හැට |
| 600 | හයසියය | 672 | හයසිය හැත්තෑ දෙක |
| 700 | හත්සියය | 785 | හත්සිය අසූ පහ |
| 800 | අටසියය | 890 | අටසිය අනූව |
| 900 | නවසියය | 999 | නවසිය අනූ නවය |
| 1000 | දහස | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 8

පහත සඳහන් වාක්‍ය කියවන්න.

(i) මම තරගයේ දෙවෙනියා වුණා.

(ii) මැරතන් තරගයේ සියවෙනියා දිනූෂා. එයා තමයි අන්තිමයා.

(iii) අපේ පාසලට පන්සිය හැටවෙනියා විධියට ඇතුළත් උනේ මම.

(iv) අපේ අයියගේ නම තියෙන්නේ හාරසිය විසිපස්වෙනි තැනට.

(v) සුරාජ් මේ සැරේ පන්තියේ දහවෙනියා.

(vi) දහවෙනි තැන එයාට ලැබුණ එක පුදුමයක්.

## ක්‍රියාකාරකම 9

උදාහරණයට අනුව දී ඇති සංඛ්‍යා හඬ නඟා කියවන්න.

ඔබේ අභ්‍යාස පොතේ එම සංඛ්‍යා අකුරින් ලියන්න.

උදාහරණය :-

113 එකසිය දහ තුන - එකසිය දහතුන්වෙනි

| | | |
|---|---|---|
| 433 | - | - |
| 546 | - | - |
| 792 | - | - |
| 818 | - | - |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.